අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112784846
isurupaya@moe.gov.lk | www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. : ED/12/1/4/වාස්මා/අභ./2024    ඔබේ අංකය / உமது இல. / Your Ref. :    දිනය / திகதி / Date : 2023.12. 13

අමාත්‍යාංශයේ සියලුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්,
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
ජාතික පාසල් විදුහල්පතිවරුන්,

**ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් – 2024**

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2023 අනුව උක්ත කරුණ සම්බන්ධයෙන් 2023.11.06 දිනැතිව මවිසින් නිකුත් කරන ලද අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම් නියෝගය අනුව සිදු කරන ලද, මේ සමග අමුණා ඇති උපලේඛන වල සඳහන් ස්ථාන මාරුවීම් 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක කිරීම අනුමත කරමි.

02. එකී උපලේඛනවල සඳහන් සංවර්ධන නිලධාරි සේවයේ, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ, ඒකාබද්ධ රියදුරු සේවයේ හා කාර්යාල සේවක සේවයේ ස්ථාන මාරුවීම් පිළිබඳව අදාළ සියළුම නිලධරයන් දැනුම්වත් කළ යුතු අතර, 2024 පෙබරවාරි 01 දින අභිනව සේවා ස්ථානයේ වැඩ භාරගැනීමට හැකි වන පරිදි එකී නිලධරයන් ඔවුන්ගේ අනුප්‍රාප්තික නිලධරයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන විධිමත් පරිදි රාජකාරි කටයුතු වලින් මුදාහැරිය යුතුය.

03. තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳව වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවෙහි අවධානය යොමු වී නොමැත්තේ නම් පමණක් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත කරුණු ඉදිරිපත් කළ හැකිය. එකී කරුණු ඉදිරිපත් කිරීම (ඉල්ලීම) මෙයට ඇමුණුම 01 වශයෙන් යා කොට ඇති ආකෘතිය අනුව සකසා 2023 දෙසැම්බර් මස 27 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පිටපතක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා) වෙත <u>0112784864 යන අංකයට ෆැක්ස් මගින්</u> යොමු කරන ලෙසද කාරුණිකව දන්වමි.

සුභාෂිණී කුලතුංග මුදලි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා)

අත්/ කළේ: එම්.එන්. රණසිංහ
අධ්‍යාපන ලේකම්

පිටපත : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැ.ගැ.ස.

ඇමුණුම 01

ඔබේ අංකය : .......................................

නම : .........................................................

තනතුර : .........................................................

ලිපිනය : ...................................................

දිනය : .....................................................

අධ්‍යාපන අමාත්‍යාංශයේ අංශ භාර මාණ්ඩලික නිලධාරි/අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්/ විභාග කොමසාරිස් ජනරාල්/ පීඨාධිපති/ විදුහල්පති /ගුරු විදුහල්පති මගින්,

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා යෝජිත වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම**

ඔබගේ අංක ............................................... හා ........................දිනැති ලිපිය/යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛනය මගින් මා ........................................................ වෙත ස්ථාන මාරු කිරීමට යෝජිත බවට / ස්ථාන මාරුව ලබා දීමට නොහැකි බව දන්වා ඇත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත ස්ථාන මාරුව / ස්ථාන මාරු ඉල්ලීම, අවලංගු කරන ලෙස/ සංශෝධනය කරන ලෙස/නැවත සලකා බලන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයෙහි 209 වන වගන්තිය ප්‍රකාරව ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

2.1 .........................................................................................................................

2.2 .........................................................................................................................

2.3 .........................................................................................................................

03. ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් ලියවිලිවල සහතික කළ ඡායා පිටපත් මේ සමග යා කර ඇත.

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබාදෙන ලෙස ද ඉල්ලමි.

පළමු මනාපය ................................................................................

දෙවන මනාපය ................................................................................

තෙවන මනාපය ................................................................................

.............................................
අත්සන

පිටපත් 1.අධ්‍යාපන අමාත්‍යාංශයේ අංශ භාර මාණ්ඩලික නිලධාරි
2.අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
3.විභාග කොමසාරිස් ජනරාල්
4.කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ................................................
5.විදුහල්පති/ පීඨාධිපති ..................................විද්‍යාලය/ ගුරු විදුහල/විද්‍යාපීඨය

**මාණ්ඩලික නිලධාරි/අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්/ විභාග කොමසාරිස් ජනරාල් / පීඨාධිපති/ විදුහල්පති/ ගුරු විදුහල්පති ගේ නිර්දේශය**

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

..............................................................මයා/මිය/මෙනවිය විසින් ඉහතින් දක්වා ඇති කරුණු සත්‍ය බවට සෑහීමට පත්වෙමි/ නොවෙමි. ඉල්ලීම ඉටු කිරීම නිර්දේශ කරමි / නොකරමි.

අත්සන ..................................................

නම ..................................................

තනතුර ..................................................

නිල මුද්‍රාව ..................................................

දිනය ..................................